1656 දී කොළඹ අත්පත් කර ගැනීමේ සටනේ දී මියගිය ලන්දේසි කපිතාන්වරයකු වූ ජෙරාඩ් පීටර්සන් හල්ෆ්ට්ගේ නමින් හල්ෆ්ට් යන්න ද, ඉංග්‍රීසි බසින් කුඩා ගම්මානය යන අරුත දෙන ඩොර්ප් (dorp ) යන වදන ද එක්ව සැදී හල්ෆ්ට්ගේ ගම්මානය හෙවත් හල්ෆ්ට්ස් ඩොර්ප් පෙදෙස මෙරට නීති ක්ෂේත්‍රයෙහි කේන්ද්‍රස්ථානයයි.

මෙරට උපරිමාධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, කොළඹ සිවිල් අභියාචනා මහාධිකරණය, මහාධිකරණය, වාණිජ මහාධිකරණය, දිසා අධිකරණය සහ මහේස්ත්‍රාත් අධිකරණය යන සියල්ලක්ම මෙහි පිහිටා තිබේ. එපමණක් නොව පරිපාලන ආයතනයන් වන අධිකරණ සේවා කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව සහ අධිකරණ අමාත්‍යාංශය පවා පිහිටා ඇත්තේ මෙහිය. යුක්තිය පසිඳලන එකී සියලුම ආයතනයන් වෙත ඇතුළත්වීමේ ද්වාරය ලෙස ක්‍රියා කරන්නේ 1874 වසරේ දී සිලෝන් ලෝ කොලේජ් (Ceylon Law College) නමින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා නීති විද්‍යාලයයි. එම අභිමානවත් මෙහෙවරෙහි 150 වැනි සැමරුම මෙම වසරට යෙදී තිබේ.

බ්‍රිතාන්‍ය පාලනය යටතේ මෙරට නීති අධ්‍යාපනය වඩාත් විධිමත් ආකාරයකින් ක්‍රියාත්මක වීම ඇරඹියේ 1833 අධිකරණ ප්‍රතිසංස්කරණ යටතේය. ඒ අනුව හැකියාව, දැනුම, දක්ෂතාව සහ යහපත් නාමයක් (Good Reputation) සහිත අය සිය සේවාදායකයන් වෙනුවෙන් අධිකරණය ඉදිරියේ පෙනී සිටිය හැකි බලයෙන් යුත් අධිනීතිඥයන් සහ පෙරකදෝරුවන් ලෙස බඳවා ගැනීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතු විය.

මෙහිදී නීති අධ්‍යාපනය ලබාදෙන ලද්දේ මුළුමනින්ම පාහේ ආධුනිකත්ව පුහුණු ක්‍රමයට අනුවයි. නීති සිසුවෙක් වෘත්තිමය නීතිඥයකු යටතේ වසර කිහිපයක් සේවය කරමින් සිය පුහුණුව ලබා ගත යුතු වූ අතර ඒ වෙනුවෙන් එම නීතිඥයාට ගෙවීමක් කළ යුතු විය. මෙම ක්‍රමයේ පැවැති අඩුපාඩු වළක්වාලමින් විධිමත් නීති අධ්‍යාපනයක් ලබා දෙනු පිණිස 1873 අංක 19 දරන ආඥාපනත යටතේ නීති අධ්‍යාපන සභාව (Council of Legal Education) ස්ථාපනය කෙරිණි. ඒ යටතේ නීති විද්‍යාලය පිහිටුවනු ලැබිණි. එවකට මෙරට අග්‍රවිනිශ්චයකාරවරයා ලෙස කටයුතු කළ ප්‍රකට නීතිවේදියකු වූ ශ්‍රීමත් එඩ්වඩ් ෂෙපර්ඩ් ක්‍රීසි මහතාගේ දිගු දැක්ම අනුව යමින් 1874 වසරේ සිට නීති විද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු ආරම්භ විය. නීති විද්‍යාලයේ දේශකයන් වශයෙන් අධිකරණ කටයුතුවල නියැළෙන පළපුරුදු නීතිඥවරුන් කටයුතු කරන ලද අතර පසුකාලීනව විශ්වවිද්‍යාල ආචාර්යවරුහු ද ඊට එක් වූහ.

ඉන් අනතුරුව නීති අධ්‍යාපනයේ විධිමත්භාවය ඇතිකරමින් අධිනීතිඥයන් සහ පෙරකදෝරුවන් බඳවා ගැනීම පාලනය කරනු පිණිස 1889 අංක 1 දරන උසාවි ආඥාපනත යටතේ නීති සම්පාදනය කරන ලද්දේ එවකට නීති අධ්‍යාපන සභාවේ සාමාජිකයකු වූ ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් මහතා විසිනි.

1874 වසරේ දී ඇරඹි නීති විද්‍යාලයට 1897 වසරේ පටන් නීති සිසුන් සඳහා පුස්තකාල පහසුකම් ලබාදෙනු ලැබූ අතර 1894 වසරේදී නීති ශිෂ්‍ය සංගමය පිහිටුවනු ලැබිණි.

1900 අංක 02 දරන ආඥාපනත මඟින් නීති අධ්‍යාපන සභාව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව (Incorporated Council of Legal Education) බවට පත්කරන ලද අතර එමඟින් එය රජයෙන් කිසිදු

# 150 වසරක අභිමන් සමරන

# ශ්‍රී ලංකා නීති විද්‍යාලය

ප්‍රතිපාදනයක් ලබා නොගන්නා මූල්‍යමය වශයෙන් ස්වාධීන ආයතනයක් බවට පත්විය.

ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවෙත්ම නීති විද්‍යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක අවශ්‍යතාව පැන නැඟිණි. ඒ අනුව 1911 වසරේදී එවකට අග්‍රවිනිශ්චයකාරයා වූ ශ්‍රීමත් ජේ.ටී. හචින්සන් මහතා විසින් නීති විද්‍යාල ගොඩනැගිල්ල සඳහා මුල්ගල් තබන ලදී. එද සිට අද වෙන තෙක් වසර 113 ක් නීති විද්‍යාලය සඳහා සෙවණ දෙන්නේ එම ගොඩනැගිල්ලයි.

මෙරට අධ්‍යාපනයේ නවමු පිටුවක් පෙරළමින් කාන්තාවන් සඳහා නීති අධ්‍යාපනය ලබාදීම 1934 වසරේදී ආරම්භ කෙරිණි. කාලයක පටන් පැවැති අවශ්‍යතාවක් සපුරාලමින් නීති ශිෂ්‍ය නේවාසිකාගාරය (Voet Inn) 1949 වසරේ දී ආරම්භ කළ අතර ඊට අනුග්‍රාහකත්වය දක්වන ලද්දේ රාජ නීතිඥ එන්.ඊ. වීරසූරිය මහතා විසිනි.

මුල් වකවානුවේ නීති අධ්‍යාපන සභාවේ රෙජිස්ට්‍රාර්වරයා නීති විද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කටයුතු පිළිබඳ සොයා බලන ලදී. 1935 වසරේ දී නීති විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස කටයුතු කිරීමේ වගකීම නීති අධ්‍යාපන සභාවේ රෙජිස්ට්‍රාර්වරයාට පැවරුණු අතර එසේ



පත් වූ ප්‍රථම විදුහල්පතිවරයා වූයේ බ්‍රිටෝ මුතුනායගම් මහතායි.

1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත මඟින් අධිනීතිඥයන් සහ පෙරකදෝරුවන් යන අංශ දෙකම එක් කොට ඔවුන්ට ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ යන පොදු නාමය භාවිතය ආරම්භ කරනු ලැබිණි.


නීති ප්‍රවේශ විභාගයෙන් සමත්ව නීති විද්‍යාලයට ඇතුළත්වන සිසුන්ට අමතරව මෙරට රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල වලින් බිහිවෙන සියලුම නීතිවේදී උපාධිධාරීන් ද වෘත්තීය මට්ටමේ නීතිඥයන් බවට පත් කරලනු ලබන්නේ ශ්‍රී ලංකා නීති විද්‍යාලයයි.

ශ්‍රී ලංකා නීති විද්‍යාලය ගෙවී ගිය සියවසකුත් තවත් පනස් වසක කාලය තුළ මෙරට නීති ක්ෂේත්‍රය, දේශපාලන ක්ෂේත්‍රය සහ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි පවා කැපී පෙනුණු චරිත ගණනාවක් බිහි කොට ඇත. මෙරට ජනාධිපතිවරුන් ලෙස කටයුතු කළ ජේ.ආර්. ජයවර්ධන සහ මහින්ද රාජපක්ෂ යන මහත්වරු ද වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ද නීති විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූවෝය. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර, ශ්‍රීමත් සිරිල් ද සොයිසා, ශ්‍රීමත් ලලිත රාජපක්ෂ, ගාමිණී දිසානායක යනාදී කීර්තිධර දේශපාලනඥයන් ගණනාවක් ද නීති විද්‍යාලයේ ආදි සිසුන් වූහ. එමෙන්ම වත්මන් අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතා ප්‍රධානව මෙරට පත් වූ සියලුම ශ්‍රී ලාංකික අග්‍රවිනිශ්චයකාරවරුන්, ශ්‍රේෂ්ඨාධිකරණ සහ අනෙකුත් අධිකරණ විනිශ්චයකාරවරුන් මෙන්ම සියලුම ලාංකික නීතිපතිවරුන් සහ නීතිඥ සංගම් සභාපතිවරුන් ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් වෘත්තීය නීති අධ්‍යාපනය ලැබූවෝය.

එවන් අභිමානයකට උරුමකම් කියන ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 150 වැනි සැමරුම ඉතා උසස් අන්දමින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් සම්පාදනය වෙමින් පවතී. වසර 113 ක් ඉපැරණි නීති විද්‍යාලයීය ගොඩනැගිල්ල ද ප්‍රතිසංස්කරණයකට ලක් වෙන අතරම ඉගෙනුම් පරිසරයේ සහ පුස්තකාල පහසුකම් ආදී අනෙකුත් පහසුකම්වල කැපී පෙනෙන වෙනස්කම් සිදු කිරීමට ද කටයුතු සම්පාදනය වෙමින් තිබේ. විෂය නිර්දේශයන් ද කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් අදාළ වෙනස්කම්වලට භාජනය කෙරෙන අතර විද්‍යාලය තුළ ආදර්ශ උසාවි (Mooting) පහසුකම් සැපයීම සහ මහජන වගකීම් ඉටුකිරීම වෙනුවෙන් යුක්ති ප්‍රවේශ වැඩසටහන් ද දියත් කිරීමට අපේක්ෂිතය. නීති අධ්‍යාපනය සඳහා වැදගත් වෙන ඉංග්‍රීසි අධ්‍යයන කේන්ද්‍රයක් ඇරඹීමට සහ සිසුන් සඳහා අවශ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානයක් (Medical Center) පිහිටුවීමට ද අපේක්ෂිතය.

නීති විද්‍යාලයීය ඉතිහාසයේ ප්‍රථම වරට ඉන්දීය අගවිනිසුරුතුමන්ගේ සහභාගිත්වයෙන් නීති දේශනයක් සහ පර්යේෂණ සම්මන්ත්‍රණ වැඩසටහනක් පැවැත්වීමට ද කටයුතු සූදනම් කෙරෙමින් පවතී.

සංවත්සරය සැමරුම් වැඩසටහන් මාලාව පිරිත් පින්කමකින් සහ හින්දු ආගමික වැඩසටහනකින් ආරම්භ කෙරුණු අතර කාව්‍යමය සංවාද වැඩසටහනක්, සමරු මුද්දර නිකුතුවක් සහ Back to Law College වැඩසටහනක් පැවැත්වීමට ද නියමිතය. මෙම කටයුතු වෙනුවෙන් අප හා අත්වැල් බැඳගන්නා මෙන් මෙරට සියලුම නීතිඥ ප්‍රජාවගෙන් නීති විද්‍යාලය වෙනුවෙන් මම ඉල්ලා සිටිමි.



**ආචාර්ය අතුල පතිනායක,**
**විදුහල්පති,**
**ශ්‍රී ලංකා නීති විද්‍යාලය**